20




# මුද්දරයේ කතන්දරය

"**විනෝදාංශ රජ**" ලෙස සැලකෙන මුද්දර එකතු කිරීම බාල මහලු භේදයක් නොමැති ව දුප්පත් පොහොසත් බොහෝ දෙනා ප්‍රිය කරන විනෝදාංශයකි.

මුද්දර සහ තැපැල් සේවාව අතර ඉතා සමීප සම්බන්ධයක් ඇත. 15 වන සියවසේ දී යුරෝපයේ රටවල් කීපයක තැපැල් සේවාව ආරම්භ වූ බවට සාක්ෂි තිබේ. එහෙත් ඒ පණිවුඩ හුවමාරු කර ගැනීම්, රජ පවුල්වල අයට පමණක් සීමා වූ බව පෙනේ. ක්‍රි. ව. 1642 දී එංගලන්තයේ එඩ්වඩ් රජතුමාගේ කාලයේ දී රජතුමාට කිසියම් ගාස්තුවක් ගෙවා පණිවුඩ යැවීමට රටවැසියන්ට පුළුවන් විය. මෙසේ පොදු ජනයාට ද පණිවුඩ හුවමාරු කර ගැනීමේ අවස්ථාවක් **උදාවීම** වැදගත් පියවරකි. මුල් කාලයේ දී ලිපියක් ලබන තැනැත්තා ගාස්තුව ගෙවිය යුතු විය. ලිපිය ලබන්නා ගාස්තුව ගෙවීම ප්‍රතික්ෂේප කළහොත් වැය වූ මුදල අය කර ගන්නේ කෙසේ ද යන ප්‍රශ්නය පැන නැගුණේ ය. ලිපියක් යවන විට ම මුද්දරයක් ඇලවීමෙන් ගාස්තුව අය කර ගත හැකි බව බ්‍රිතාන්‍ය ජාතික **රෝලන්ඩ් හිල්** මහතා පෙන්වා දුන්නේ ය.

එහෙයින් බර්මිංහැම් නගරයේ විසූ රෝලන්ඩ් හිල් මහතා මුද්දරයේ නිර්මාතෘ ලෙස සැලකෙයි. 1846 මැයි 6 වනදා එංගලන්තයේ දී ලෝකයේ ප්‍රථම මුද්දරය බිහිවිණි. එය **"පෙනී බ්ලැක්"** නමින් හැඳින්විණි.





වික්ටෝරියා රැජිනගේ උඩුකයේ රූපය සහිත එම මුද්දරයේ වටිනාකම පැන්ස 1 කි. පෙනී බ්ලැක් මුද්දරයේ, නිකුත් කළ රට සඳහන් නොවේ. මුද්දරවල රට සඳහන් නොකිරීමේ සම්ප්‍රදය තවමත් එංගලන්තයේ පවතී. රටේ නම සඳහන් නොකර මුද්දර නිකුත් කරන එක ම රට එංගලන්තයයි.

බ්‍රිතාන්‍යයේ යටත් විජිතයක් ව පැවති ලංකාවේ ප්‍රථම තැපැල් මුද්දරය නිකුත් වූයේ 1857 අප්‍රේල් 1 වැනි ද ය. වික්ටෝරියා රැජිනගේ උඩුකයේ රූපය දක්වෙන එම මුද්දරයේ වටිනාකම පැන්ස 6 කි. 1857 සිට 1872 දක්වා වූ වකවානුවේ දී ලංකාවේ භාවිත වූයේ පැන්ස, සිලිං වටිනාකම්වලින් යුතු මුද්දර ය.





මුද්දර ප්‍රධාන වශයෙන් වර්ග දෙකකි. එනම් **තැපැල් මුද්දර** සහ **ආදායම් මුද්දර** ය. දැනට අප රටෙහි සත 10 සිට රුපියල් 200 දක්වා වූ සියලු ම මුද්දර තැපැල් සහ ආදායම් ගාස්තු වශයෙන් ගෙවිය හැකි ය. රු. 500 සහ රු. 1000 ආදායම් මුද්දර ය. තැපැල් මුද්දර නැවත කාණ්ඩ දෙකකට බෙදෙයි. එනම් **නිත්‍ය**

**කාණ්ඩයේ මුද්දර** සහ **සමරු මුද්දර** යනුවෙනි . කිසියම් විශේෂ සිදුවීමක්, රටෙහි වැදගත් දෑ, දේශයට හෝ භාෂා සාහිත්‍යයට උදාර සේවයක් ඉටු කළ පුද්ගලයන් සිහි කිරීමට **සමරු මුද්දර** නිකුත් කෙරෙයි. ලංකාවේ ප්‍රථම සමරු මුද්දරය නිකුත්වූයේ 1935 දී ය. ඉන් පසු 1948 පෙබරවාරි මස 04 වැනි දා නිදහස ලැබීම නිමිති කොට ගෙන නිකුත් වූ මුද්දරයෙහි ප්‍රථම අග්‍රාමාත්‍ය ඩී. ඇස් සේනානායක මහතාගේ රූපයක් ද සිලෝන් වෙනුවට **ශ්‍රී ලංකා** යන වචනය ද පාවිච්චි විණි.










පළමු වරට මුද්දරයක් නිකුත් කරන විට **මුල් දින කවරය** යනුවෙන් හැඳින්වෙන කවරයක් අලෙවි කරනු ලැබෙයි. ඒ සමග එම මුද්දරය පිළිබඳ තොරතුරු රැසක් සඳහන් වන **"මුද්දර නිවේදන"** නම් වූ පත්‍රිකාවක් ද නොමිලයේ සැපයෙයි.





1999.11.11 වැනි ද **විශිෂ්ට පෞරුෂ** නම් ශීර්ෂය යටතේ මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර මහතාගේ උඩුකය දැක්වෙන මුද්දරයක් නිකුත් විය. මුද්දර නිවේදන-යෙහි 1914 ජූනි 10 වැනි දා එතුමා උපත ලැබූ බව, අධ්‍යාපනය ලැබූ පාසල් සහ විශ්වවිද්‍යාල, ලියූ පොත් පත් සහ සිංහල සාහිත්‍යයට එතුමාගෙන් සිදුවූ සේවය, පිරිනමනු ලැබූ දේශීය විදේශීය සම්මාන, 1996 අගෝස්තු 16 වන ද අභාවප්‍රාප්ත වූ බව ආදි ජීවන තොරතුරු රාශියක් ඇතුළත් විය.




**ඔලිම්පික් සමරු මුද්දරය 2000**

වැදගත් සමරු මුද්දර කීපයක තොරතුරු පහත දක්වෙයි.







| | |
|---|---|
| 23. 05. 1956 | විජය කුමරුගේ පැමිණීම |
| 01. 02. 1966 | ශ්‍රී ලංකාවේ වැව් සහ ගංගා |
| 26. 11. 1970 | කැප්පෙටිපොළ දිසාව |
| 29. 10. 1971 | කුමාරතුංග මුනිදස<br>ආනන්ද රාජකරුණා<br>ඇස්. මහින්ද හිමි<br>ආනන්ද කුමාරස්වාමි |
| 11. 08. 1989 | ශ්‍රී ලංකාවේ දියඇලි |
| 10. 11. 1989 | ප්‍රථම සඳ තරණය සහ අජටාකාශගාමින් |
| 12. 09. 1994 | ආදිවාසීන් |
| 18. 02. 1998 | බාලදක්ෂ සංගමය |
| 07. 12. 1998 | කාලගුණය හැඳින්වෙන සංකේත |
| 07. 09. 1999 | ඔලිම්පික් ක්‍රීඩා |
| 06. 05. 2006 | ලෝකයේ ප්‍රථම තැපැල් මුද්දරය (160 වන සංවත්සරය) |

සෑම වර්ෂයක ම වෙසක් සහ නත්තල් නිමිත්තෙන් අලුත් මුද්දර කට්ටල ද, සම්භාවනීය පුද්ගලයින්, වැදගත් සිද්ධීන්

සැමරීමට මුද්දර කීපයක් ද මුද්දර කාර්යාංශය නිකුත් කරයි.

මුද්දරයක් රටක් නියෝජනය කරන තානාපතිවරයකු වැනි ය. කිසියම් රටක ජාතික වීරවරයන්, ආවේණික වෘක්ෂලතා, කුරුල්ලන් සහ මල් වර්ග, රටවාසීන් වැදගත් කොට සලකන දෑ ආදි කරුණු රාශියක් මුද්දරවලින් හෙළි වෙයි.




මුද්දර එකතු කිරීම ක්‍රමවත් ව පිරිසිදු ව ප්‍රවේසමෙන් කළ යුතු සියුම් කටයුත්තකි. කුරුල්ලන්, මල් වර්ග ආදි තේමා යටතේ හෝ රට රටවල මුද්දර වශයෙන් හෝ තමන් කැමති ආකාරයකට මුද්දර රැස් කළ හැකි ය. ඒවා මුද්දර සුරැකුම් පොතක ඇලවිය යුතු ය. කුඩා කාලයේ සිට මුද්දර එකතු කරන්නා තම ජීවිතය ද ක්‍රමානුකූල ව හැඩ ගස්වා ගැනීමට පෙලඹෙයි. මුද්දර ලෝලියා හැම විටම තමාගේ මුද්දර එකතුව තර කර ගැනීමට වෙර දරයි. ඔහු ලෝකයේ වෙනත් රටවල මුද්දර රැස් කරන්නන් සමග සම්බන්ධ වෙමින් ලියුම් හුවමාරු කර ගනියි. මුද්දර එකතු කරමින් මෙම විනෝදාංශයෙහි යෙදෙන්නාට ටික කලක් ගත වන විට තමාගේ මුද්දර එකතුව දෙස බලා සතුටු විය හැකි ය. “මා අසනීප ව සිටිය දී මගේ මුද්දර පොත පෙරළා බැලීමෙන් බේත්හේත්වලින් නොලද සුවයක් ලදිමි.” යැයි අමෙරිකානු ජනාධිපතිවරයෙකු ව සිටි ෆ්‍රෑන්ක්ලින් රූස්වෙල්ට් මහතා ප්‍රකාශ කර ඇත. මුද්දර එක්රැස් කිරීම දුක සැප දෙකේ දී ම මානසික සුවයක් ලබා දෙන බව ඉන් පෙනෙයි.

මුද්දරයක් පැරණි වන විට වටිනාකම වැඩි වෙයි. සමස්ත

ලෝකයේ ම මුද්දර පිළිබඳ තොරතුරු සපයන මධ්‍යස්ථානය ඇත්තේ බ්‍රිතාන්‍යයෙහි ය. එහි ස්ටැන්ලි ගිබන්ස් නම් සමාගම මුද්දරවල වටිනාකම තක්සේරු කරමින් සඟරාවක් පළ කරයි. එම සඟරාවට අනුව ලංකාවේ 1859 අප්‍රේල් 23 දා නිකුත් වූ පැන්ස 4 ක වටිනාකමින් යුත් වික්ටෝරියා රැජිනගේ උඩුකය සහිත මුද්දරයේ වර්තමාන වටිනාකම ස්ටර්ලින් පවුම් 50000 කි. මෙසේ බලන කල මුද්දර රැස් කිරීමට හුරුපුරුදු වීමෙන් ලාභ ද ලැබිය හැකි ය. මුද්දර එකතු කිරීම, ක්‍රමවත් ව වැඩ කිරීමේ පුරුද්ද ඇති කරන, රට තොට පිළිබඳ දැනුම ලබා දෙන ලොකු කුඩා කාටත් ප්‍රයෝජනවත් විනෝදාංශයකි.




## අවබෝධය

1. ලෝකයේ ප්‍රථම මුද්දරය බිහි වූයේ කුමන රටෙහි ද? කවදා ද?

2. ශ්‍රී ලංකාවේ පළමුවෙන් ම නිකුත් කරන ලද මුද්දරය ගැන විස්තර කරන්න.

3. i. තැපැල් මුද්දර කාණ්ඩ දෙකකට බෙදෙන බව මෙහි සඳහන් කර ඇත. ඒවා මොනවා ද?

   ii. පාවිච්චි කළ හෝ නොකළ මුද්දරයක් ගෙන එය කුමන කාණ්ඩයකට අයිති දැයි විමසා බලන්න.

4. පහත දක්වෙන නිගමන කියවන්න. නිවැරදි ඒවා තෝරා පැහැදිලි අකුරින් ඔබේ අභ්‍යාස පොතේ ලියන්න.

   i. මුද්දර එකතු කිරීම පාසල් ළමයින් අතර පමණක් ජනප්‍රිය වූ විනෝදාංශයකි.

ii. මුද්දර රැස් කිරීම වයස් භේදයකින් තොර ව බොහෝ දෙනා අතර ජනප්‍රිය වූ විනෝදාංශයකි.

iii. බ්‍රිතාන්‍යයේ රෝලන්ඩ් හිල් මහතා මුද්දරයේ නිර්මාතෘ ලෙස සැලකෙයි.

iv. ලංකාවේ මුද්දර භාවිතය ආරම්භ වූයේ විසි වන ශත වර්ෂයේ දී ය.

v. ලංකාවේ මුද්දර භාවිතය ආරම්භ වූයේ දහ නව වන සියවසේ දී ය.

vi. ලංකාවේ මුල් යුගයේ මුද්දරවල වටිනාකම දැක්වූයේ සිලිං පැන්සවලිනි.

vii. පැරණි වන විට මුද්දරවල වටිනාකම අඩු වෙයි.

viii. මුද්දර එකතු කිරීම ආර්ථික වශයෙන් ද ලාභ ලැබිය හැකි විනෝදාංශයකි.

**භාෂා ක්‍රියාකාරකම්**

1. **බාල මහලු** යුගල පදයකි. මෙම පාඩමෙහි යෙදී ඇති යුගල පද සොයා ලියන්න.

2. කොටුවෙහි ඇති වචනවලින් ගැළපෙන වචනය තෝරා හිස් තැනෙහි ලියන්න.

   i. කිසියම් දෙයක් නිපදවන්නා ................................

   ii. රටින් රට සැරිසරන්නා ..................................................

   iii. රටක් නියෝජනය කරන්නා ..................................................

   iv. රටට ආදරය කරන්නා ..................................................

   v. තමාගේ වාසියට පමණක් කටයුතු කරන්නා ..................................................

| | | |
|---|---|---|
| තානාපති | ආත්මාර්ථකාමියා | නිර්මාතෘ |
| සංචාරකයා | දේශ ගවේෂක | දේශප්‍රේමියා |